යටවත්ත ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 16 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට යටවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේ ගබඩාවේ පැවති රු.117,500 ක් වූ ජල මනු 50 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | මෙම ජල මනු මිලට ගන්නා අවස්ථාවේදීම අදාළ වැය ශීර්ෂ හර කොට ඇත. අදාළ ජල මනු තොගය ජ'නල් සටහන් මඟින් ගැළපීම් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ආපසු ගෙවිය යුතු තැන්පත් ගිණුමේ ශේෂය රු.692,965 කින් වැඩියෙන් දක්වා තිබුණි. | වැඩියෙන් දක්වා තිබූ වටිනාකම ගිණුම්වල නිවැරදි කළ යුතු වේ. | 2019 වර්ෂයේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ලැබිය යුතු ගිණුම්** | | |
| වර්ෂ 3 ක් ඉක්මවූ ලැබිය යුතු ශේෂවල එකතුව රු.172,288 ක් විය. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) ගෙවිය යුතු ගිණුම්** | | |
| වර්ෂ 3 ක් ඉක්මවූ ගෙවිය යුතු ශේෂවල එකතුව රු.325,103 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.63,891,876 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | සමීක්ෂණයන් සිදුකර වාර්තා ඉදිරිපත් කිරීම හා උපලේඛන පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වේ. | 2020 වර්ෂයේදී අදාළ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කරන බව හා ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | |
| | 218 රීතිය | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි මංමාවත් සම්බන්ධයෙන් සභාව ආරම්භයේ සිට මේ දක්වා සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉඩම්, ගොඩනැගිලි හා මංමාවත් සමීක්ෂණය කළ යුතු වේ. | සමීක්ෂණ කටයුතු මෙම වසරේදී නිම කරන බව දන්වමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 සහ 571 | වර්ෂ 2 ක කාලයක් ඉක්මවූ රු.239,406 ක පොදු තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කාලය ඉකුත් වූ තැන්පතු නිරවුල් කළ යුතු වේ. | ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,675,629 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,166,135 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,087,000 | 1,398,987 | 1,272,854 | 199,501 | 2,010,200 | 1,074,882 | 1,561,829 | 270,228 |
| (ii) | කුලී | 1,221,000 | - | 1,020,275 | - | 2,286,506 | - | 814,226 | 14,500 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 915,060 | - | 1,039,458 | - | 395,370 | - | 370,894 | - |
| (iv) | වෙනත් ආදායම් | 5,840,300 | - | 3,274,945 | - | 2,820,704 | - | 1,541,696 | 202,714 |
| | එකතුව | 9,063,360 | 1,398,987 | 6,607,532 | 199,501 | 7,512,780 | 1,074,882 | 4,288,645 | 487,442 |

### 2.2.2 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.30,281 ක හිඟ අක්කර බදු ශේෂයක් විය. | අය කර ගත හැකි බදු අය කර ගැනීමත් ඉතිරි බදු සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. | හිඟ ගාස්තු අයකර ගැනීමට මේ වන විට සමීක්ෂණ සිදු කරන අතර අය කර ගැනීමට හැකි ගාස්තු අය කර ඉතිරි මුදල කපා හැරීමට නියමිතය. |

### 2.2.3 ජල ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල යෝජනාක්‍රම 5 ක රු.149,670 ක හිඟ ශේෂයක් අය කරගෙන නොතිබුණි. 2019 අප්‍රේල් 30 දිනට රු.83,315 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි. | හිඟ මුදල අය කර ගත යුතු වේ. | ජල ගාස්තු හිඟයෙන් මේ වන විට රු.66,355 ක මුදලක් මේ වන විට අයකර ඇති අතර ඉතිරි හිඟ මුදල වන රු.83,315 මේ වන විට අය කර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු | හිඟ ශේෂයන් අය කරගත යුතු වේ. | මුද්දර ගාස්තු රු.9,376,433 ක හිඟ මුදලින් මේ වන විට |

| | | |
|---|---|---|
| රු.9,376,433 ක් වූ අතර 2019 අප්‍රේල් 30 දිනට මුද්දර ගාස්තු රු.8,762,439 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි. | | රු.613,994 ක මුදලක් අය කර ඇති අතර ඉතිරි මුදල් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |

2.2.5 අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂවලදී පැනවූ අධිභාරවලට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.32,259 ක අධිභාර මුදලක් අය කර ගැනීමට තිබුණි. | අය කිරීමට කටයුතු කිරීම හා අධිභාර නොගෙවන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2018 ගිණුම් කාරක සභාවේදී මෙම මුදල අය කර ගැනීමට පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා වෙත නියෝග කර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පරිගණක උපදේශකවරයෙකු නොමැතිකම හේතුවෙන් වසර 2 කට පමණ ආසන්න කාලයක සිට රු.607,616 ක් වටිනා පරිගණක උපාංග සහිත ඉ-නැණ පියස මධ්‍යස්ථානය කිසිදු භාවිතයකින් තොරව අත්හැර දමා තිබුණි. ඒ සඳහා ලබාදී තිබූ සම්පත්වලින් කොටසක් සහා කාර්යාලයේ ප්‍රයෝජනයට යොදාගෙන ඉතිරි සම්පත් නිෂ්කාර්යව පැවතුණි. | උපදේශකවරයෙකු බඳවාගෙන ඉ-නැණ පියසේ කටයුතු කඩිනමින් ආරම්භ කළ යුතු වේ. | ඉ - නැණ පියස මධ්‍යස්ථානය සඳහා උපදේශකවරයෙකු බඳවාගෙන ගෙවීම් කටයුතු කිරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු බැවින්, ඒ සඳහා ව්‍යාපෘති වාර්තා සකස්කර විෂයභාර අමාත්‍යවරයා වෙත යැවීමට කටයුතු කරමි. |

(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා සහා අරමුදල් භාවිතා කර ඉදිකර තිබූ රු.659,062 ක් වටිනා ගොඩනැගිල්ල හා රු.700,000 ක් වටිනා කොම්පෝස්ට් අංගනය කොම්පෝස්ට් නිෂ්පාදනයක් සඳහා යොදාගෙන නොතිබුණි. | දිරන කසළ භාවිතා කර කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ ගොඩනැගිල්ලෙහි කොම්පෝස්ට් සකස් කිරීමට ප්‍රදේශවාසින්ගේ දැඩි විරෝධය මතුවීම නිසා දිරාපත් කසළ ගොඩ ගැසීමට නොහැකි විය. නමුත් මෙහි නොදිරන කසළ ද්‍රව්‍ය තෝරා සකස් කිරීම සඳහා භාවිතා කරන බව දන්වා සිටිමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට 2018 වර්ෂයේ අයවැය වැඩසටහන් 11 ක් සඳහා රු.156,000 ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් එම ප්‍රතිපාදන උපයෝජනය කර තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. | තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා ප්‍රතිපාදන සලසා තිබූ නමුත් පැවති කාර්ය බහුලත්වය හා සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු කිරීමට සිදුවීම මත යම් ප්‍රමාද දෝෂයක් සිදුවී ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23"ඇ" වගන්තිය යටතේ පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යවසායන් 24 ක් පරිසර බලපත්‍රය නොගෙන ව්‍යාපාර කටයුතු කරගෙන යමින් පැවතුණි. | බලපත්‍ර නිකුත් කළ යුතු ඒකකවලට බලපත්‍ර නිකුත් කළ යුතු වේ. | ඉතා සුළු වශයෙන් සිදු කරනු ලබන ව්‍යාපාර හිමියන් පරිසර බලපත්‍ර ලබා ගැනීමට උනන්දු නොවේ. එමෙන්ම එම ව්‍යාපාරවලින් වන පරිසර හානියද අවම වන බැවින් හා ඒ අයගේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින් බලපත්‍ර ලබාදීම කෙරෙහි ක්‍රියාත්මක නොවේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ද්විතීක මට්ටමේ තනතුරු 09 ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු වූ තනතුරු කඩිනමින් සම්පූර්ණ කරගත යුතු වේ. | එම පුරප්පාඩු පිළිබඳව අප විසින් පළාත් පාලන කොමසාරිස්වරයා වෙත ඉල්ලීම් සිදුකර ඇත. පුරප්පාඩු හේතුවෙන් කාර්ය මණ්ඩලය දැඩි අසීරුතාවයට පත්වී ඇති අතර මාසිකව ඉහළ අධිකාරිය මේ සම්බන්ධව දැනුවත් කෙරේ. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව මඟින් නඩත්තු කරන ජල යෝජනාක්‍රම 5 කින් බෙදාහරිනු ලබන පානීය ජලය පිරිපහදු කිරීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි. | පිරිපහදු කරන ලද ජලය මහජනතාවට නිකුත් කළ යුතු වේ. | මේ වන විට ක්ලෝරීන් මිලදීගෙන ජලය පිරිපහදු කිරීමට කටයුතු සූදානම් කර ඇත. |

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩාගාර ලේකම්ගේ අංක IAI/2002/02 හා 2002 නොවැම්බර් 28 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ ලේඛන යාවත්කාලීනව නඩත්තු කළ යුතු වේ. | පරිගණක ගත ඉන්වෙන්ට්‍රියක් සකස් කර යාවත්කාලීන කර ඉදිරියේදී නිවැරදි කරමි. |

### 3.5.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඩන්කන්වත්ත පෙර පාසල හා ළමා උද්‍යානය පිළිගත හැකි තක්සේරුවක් නොකර හා ගිවිසුම්ගතව බදු කුලියක් අය නොකර මාසිකව රු.500 ක් වැනි ඉතා අඩු කුලියකට 2018 මැයි සිට පෞද්ගලික පෙර පාසල් පාලිකාවකට ලබාදී තිබුණි. | සභාව සතු වත්කම් විධිමත්ව පරිහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | නිෂ්කාර්යය වත්කමක් ලෙස සභා ගොඩනැගිල්ල පවත්වාගෙන යාමට වඩා ප්‍රදේශයේ දරුවන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් මෙම ගොඩනැගිල්ල අප විසින් කුලී පදනම මත ලබාදී ඇත. |

### 3.5.3 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රයෝජනයට ගත නොහැකි ලී බඩු හා උපකරණ අයිතම 7 ක් විධිමත් ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමකින් තොරව ගබඩාකර තිබුණි. | විධිමත් ක්‍රියාපටිපාටි අනුගමනය කර අපහරණය කළ යුතු වේ. | 2018 වර්ෂයේ වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළත් වෙන්දේසි නොවූ බව සඳහන් කරමි. මෙම භාණ්ඩ 2019 වර්ෂයේ භාණ්ඩ වෙන්දේසිය සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව දන්වමි. |
| (ආ) | සභාවෙන් ඉවත් කරන ලද ප්‍රයෝජනයට ගතහැකි වානේ ලියන මේස 8 ක් හා ලී මේස 6 ක් සභා පරිශ්‍රය තුළ ප්‍රයෝජනයට නොගෙන රඳවා තබා තිබුණි. | ප්‍රයෝජනයට ගතහැකි භාණ්ඩ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | භාණ්ඩ වෙන්දේසිය සඳහා ඉදිරිපත් කර තිබූ වානේ මේස 06 හා ලී මේස පාවිච්චි කළහැකි මට්ටමේ තිබූ බැවින් එය වෙන්දේසි නොකිරීමට තිරණය කළ බව දන්වමි. |

### 3.6 ප්‍රසම්පාදනය

#### ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.3 අනුව ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි. | සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු

----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර්තුවකට 01 බැගින් පැවැත්විය යුතු විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචිත වර්ෂය තුළ එක් අවස්ථාවකදී පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම කළ යුතු වේ. . | 2018 වර්ෂයේ විගණන හා කළමණාකරන කමිටු 2 ක් පවත්වා ඇති අතර ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |